# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு**

**கௌரவ அமைச்சரின் அவதானிப்புகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல் மற்றும் பாராளுமன்றத்தின் பொதுக் கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகளின் பிரகாரம் நிலையியற் கட்டளை 119(4) இன் கீழ் எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகள்**

Ministry of Labour and Foreign Employment

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in term of Standing Oder No. 119(4)

**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන ප්‍රගතිය |
|---|---|
| **පළමු කොටස : 95.00**<br><br>2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන හා තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි. | GPS මෘදුකාංග මුරපද වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු මේවන විට සිදු කර ඇති අතර එය යාවත්කාලීනව සිදු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | අදාළ බැරකම්, ප්‍රතිපාදන සීමාව ඉක්මවා තිබීම වළක්වාගත නොහැකි වූයේ ඒ සඳහා වවුචර්පත් නියමිත කාලසීමාවේදී ලබාගත නොහැකි වූ බැවිනි. මේ සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ අදාළ ප්‍රතිපාදනයන් මාරු කරගැනීමේ ආපේක්ෂාවෙන් කටයුතු කළ බැවින් එවැනි තත්ත්වයක් උද්ගත විය.<br><br>ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | අත්තිකාරම් ගිණුම් ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.<br><br>**ඩබ්. ඩී. ජී. සී. සුගතදාස මිය**<br>**(රාජ්‍ය කළමණාකරණ සහකාර)**<br><br>1. ඩබ්. ඩී. ජී. සී. සුගතදාස මහත්මියගේ ණය ශේෂ මුදල රු. 139,900/=ක් වන අතර අයකර ගැනීමට හැකි වී ඇත්තේ රු. 1,399/=ක් වන එක් වාරිකයක් පමණි.<br>2. ඇය පූර්ව දැනුම්දීමකින් තොරව විදේශගත වී ඇති බැවින්, මෙම ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර ඇයට විරුද්ධව නඩු පැවරීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| | 3. ඉහත කරුණු සැලකිල්ලට ගෙන අමාත්‍යාංශය මගින් ඉදිරි ණය ලබාදීමේදී රක්ෂණ ඔප්පු ඇප මත ණය ලබාදීම නවතා පුද්ගල ඇප මත පමණක් ණය ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත<br><br>**වී. පී. සී. ද මෙල් (කාර්යාල කාර්යය සහායක)**<br><br>වී.පී. චින්තක ද මෙල් මහතා විසින් ලබාගෙන ඇති රු. 114,575.60 ක ණය මුදල අය කරගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. එම නිලධාරියා වෙනත් කාර්යාලයකට ස්ථාන මාරු වී ගිය නමුත් එම කාර්යාලයේ රාජකාරී භාර නොගැනීම හේතුවෙන් සේවය හැරයාමේ නිවේදනය නිකුත් කර තිබේ. ඒ අනුව ඔහුගේ පෞද්ගලික ලිපිනයට ලිපි යොමු කර ඇත. ඔහු පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහාය ලබාගෙන ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරමින් පවතී.<br><br>**පී. බී. එස්. කුමාර (රියදුරු)**<br><br>රියදුරු පී. බී. එස්. කුමාර මහතාගෙන් අයවිය යුතු රු.44,541/=ක ණය මුදලින් රු. 5,000/- බැගින් අයකරමින් පවතින අතර 2023 ජනවාරි 01 දින වන විට ණය ශේෂය රු. 29,541/- ක් දක්වා අඩුකර ගැනීමට හැකිවී තිබේ. |
| <u>දෙවැනි කොටස : **83.00**</u><br><br>සමස්ත කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | <br><br>සමස්ත කාර්ය මණ්ඩලයට අදාළව කාර්යසාධන ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී. |

මනූෂ නානායක්කාර
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය

මනූෂ නානායක්කාර
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියස"
නාරාහේන්පිට කොළඹ 05